ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1895/8 - 2014 දෙසැම්බර් මස 30 වැනි අඟහරුවාදා - 2014.12.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : RDA/LA/COL/2013/06.
*ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/6/2013/එච්ඩබ්/503.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, කැළණිමුල්ල ගමේ පිහිටි, සර්වේ ජනරාල් වෙනුවට කොළඹ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් පිළියෙල කර ඇති අංක 9312 සහ 2014.11.04 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 01 සිට 03 දක්වා පෙන්නුම් කෙරෙන මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0635 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබලි තුන (03):

01. කැබලි අංක 24
ඉඩමේ නම: ලන්සියා කුඹුර (කොටසක්); ඉඩමේ විස්තරය: වගුරු බිම; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: කැළණිමුල්ල ශ්‍රී විජයරත්නාරාම වාසී කළුගල්ලේ ධම්මරතන හිමි; ප්‍රමාණය: හෙක්. 0.0156.

02. කැබලි අංක 26
ඉඩමේ නම: ගොඩඕවිට සහ පුවක්ගහවත්ත (කොටසක්); ඉඩමේ විස්තරය: වගුරු බිම; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: එල්. ආර්. ඩී. ශ්‍රියා ජානකී, එල්. ආර්. ඩී. විමලාවතී, එල්. ආර්. ඩී. වී. පද්මිණි සහ එල්. ආර්. ඩී. ඒ. රත්නසිරි, අංක. 135, කැළණිමුල්ල, අංගොඩ; ප්‍රමාණය: හෙක්. 0.0203.

02. කැබලි අංක 27
ඉඩමේ නම: දොඹගහවත්ත, තැඹිලිකොටුව, ගොඩඕවිට (කොටසක්); ඉඩමේ විස්තරය: වගුරු බිම; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: ඩබ්ලිව්. එච්. පෙරේරා, එම්. සී. පෙරේරා, ඩබ්ලිව්. ඩී. පෙරේරා සහ එම්. එච්. පෙරේරා, අංක. 426, කැළණිමුල්ල, අංගොඩ; ප්‍රමාණය: හෙක්. 0.0276.

ඉහත සඳහන් ඉඩමට /පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2015 ජනවාරි මස 12 දින අනුව පෙ.ව. 9.30 ට ඉඩම් අංශය, මාර්ග සංවර්ධන අධිකාරිය, 3 වන මහල, සෙත්සිරිපාය කාර්යාලයේ දී මා සම්මුඛ වියයුතුයි.

තවද 2014 දෙසැම්බර් මස 31 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

එස්. ඕපනායක,
අධ්‍යක්ෂ(ඉඩම්) සහ
ඉඩම් අත්පත් කරගැනීමේ නිලධාරී,
මාර්ග සංවර්ධන අධිකාරිය.

2014 දෙසැම්බර් මස 18 වැනි දින,
ඉඩම් අංශය,
මාර්ග සංවර්ධන අධිකාරිය,
3 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.

01-423

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : AKU/LAN/06/LA 3726.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* :2012/විවිධ උපදෙස්/විර්.

1994 ජුනි මස 03 වැනි දින අංක 821/26 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 1 ඒ පිටුවේ 7 වැනි වගන්තිය යටතේ මා විසින් දැනුම් දී ඇති 1994 ජුනි මස 29 වැනි දින පෙ. ව. 10.00 ට යන්න 2015 මාර්තු මස 04 වැනි දින ප.ව. 2.30 ට සහ 1994 ජුනි මස 22 යන්න, 2015 පෙබරවාරි මස 25 වැනි දින යනුවෙන් සංශෝධනය කල බව මෙයින් දැනුම් දෙමි. වැඩි විස්තර සඳහා 1994 ජුනි මස 03 වැනි දින අංක 821/26 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සඳහන් වේ.

ඕ. වී. චන්දන තිලකරත්න,
ප්‍රාදේශීය ලේකම්.
අකුරැස්ස.

2014 දෙසැම්බර් මස 12 වැනි දින,
අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

01-424

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.